1st Place Winner
National Productivity
Award 2020



ISO 9001
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/13/CIR.COM.(3) | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.12. 31 |
|---|---|---|---|---|---|

ලේකම්,
ධීවර අමාත්‍යාංශය,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GSP/SP/1/1/01-II හා 2025.12.30 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛ ද්විත්වය 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා දකුණු පළාත් ආණ්ඩුකාර ධුරයේ වැඩ බලන සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2025.12.29 දින අනුමැතිය ලබා දී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | ශීර්ෂය |
|---|---|---|---|
| 01 | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025 | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අත් කාර්යාල වල නිලධාරීන්ගේ රාජකාරි වේලාවන් සංශෝධනය කිරීම. |
| 02 | | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2025 | රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම. |

03. ඒ අනුව උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ශෂී තාරුකා පී. මානවඩු
සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත.

පිටපත :
01. පළාත් අධ්‍යක්ෂ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, දකුණු පළාත. - කරු. අ.ක.ස.

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number | GS/SP/1/1/01-II | ඔබේ අංකය / உமது இல. / Your Number | දිනය / திகதி / Date: 2025.12. 30 |

30 DEC 2025

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම.**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක: CSS/03/13/CIR.COM (13) හා 2025.12.29 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව, දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් කෙටුම් පත් කරන ලද දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 හා චක්‍රලේඛ අංක 02/2025 සම්බන්ධව පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව පරිපාලන හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා පත් කරන ලද කමිටුව විසින් පහත දක්වා ඇති නිර්දේශ ලබා දී ඇත.

- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක **07/2024** හා **2024.07.10, 09/2024** හා **2024.09.20,09/2024(1)** හා **2025.01.01** චක්‍රලේඛ ආශ්‍රය කොට ගෙන දකුණු පළාත් සභාව සඳහා නව චක්‍රලේඛ ද්විත්වයක් කෙටුම්පත් කිරීමටත්,
- ඒ අනුව දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2025 හා 02/2025 අනුව සකස් කරන ලද නව චක්‍රලේඛ ද්විත්වය හි සඳහන් විධිවිධාන **2026.01.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ කර ගැනීම සඳහා, දකුණු පළාත් ආණ්ඩුකාර ධුරයේ වැඩ බලන සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2025.12.29 දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා එවමි.

03. එහි පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරමි.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්,
සහකාර ආණ්ඩුකාර ලේකම්,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

[redacted]

මෙම රාජ්‍ය සේවා ආණ්ඩු/රාජ්‍ය......[redacted]...../

...........................................චක්‍රලේඛය / උපදෙස්

2026-01-01 දින සිට

2025-12-27

ක්‍රියාත්මක කරයි.

ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / සඳහා.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

දකුණු පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025

මගේ අංකය : PD/S/DAPH/AO/EST-43-3
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපෙ. මාතර

2025.12.

අතිරේක පළාත් අධ්‍යක්ෂ/විෂය විශේෂඥ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පළාත් කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට,
සියලු පශු වෛද්‍ය නිලධාරීන් / සත්ත්ව පාලන නිලධාරීන්,
ස්ථාන භාර නිලධාරීන් - සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය,
ස්ථාන භාර නිලධාරී - කැකණදුර ගොවිපොළ.

**<u>දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල වල නිලධාරීන්ගේ රාජකාරි වේලාවන් සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණට අදාළව පේරාදෙණිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024.09.20 දිනැති 09/2024 හා 2025.01.01 දිනැති 09/2024(1) චක්‍රලේඛ සංශෝධන සහිතව දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා මෙම පළාත් චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.01.01 දින නිකුත් කරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 09/2024 (i) හි අංක 2 හා 3 කරුණු අනුව,

I. රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2006.05.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 ට අනුව රජයේ සේවාවන්ට නියුතු කණිෂ්ඨ සේවකයන් හැර අනෙකුත් සියළුම සේවකයන්ගේ කාර්යාල වේලාව (දිවා භෝජනය සඳහා විනාඩි 30ක කාලය සමඟ) පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා වේ.
II. ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1:10:2 වගන්තියට අනුව සෙනසුරාදා දින සේවය කරනු ලබන නිලධාරීන් සඳහා , සතියට දින පහමාරක් (5 ½) සේවය කළ යුතු යැයි නියම කර ඇති රජයේ නිලධරයන් ලෙස සඳහන්ව ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ,

03. පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරි වේලාව පහත පරිදි අදාළ කර ගත යුතු බව කාරුණිකව දන්වමි.

| පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන් | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සතියේ දිනවල | පෙ.ව. 8.30 | ප.ව. 3.30 |
| සෙනසුරාදා දිනවල | පෙ.ව. 8.30 | ප.ව. 12.15 |

04. පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල හා පශු වෛද්‍ය කාර්යාල වල අනෙකුත් නිලධාරීන් හා සේවකයන් සඳහා පහත පරිදි රාජකාරි වේලාවන් අදාළ වේ.

[redacted]

[redacted]

| පළාත් අධ්‍යක්ෂ කාර්යාලය / නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල | පැමිණීම | පිටවීම |
|---|---|---|
| පශු වෛද්‍යවරු ඇතුළත්ව සියලු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව. 4.15 |
| කණිෂ්ඨ සේවකයින් | පෙ.ව. 8.00 | ප.ව. 4.45 |
| මුරකරු - දිවා | පෙ.ව. 6.00 | ප.ව. 6.00 |
| මුරකරු - රාත්‍රී | ප.ව. 6.00 | පෙ.ව. 6.00 |

| පශු වෛද්‍ය කාර්යාල - සතියේ දින | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් ඇතුළු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව. 3.30 |
| කණිෂ්ඨ සේවකයින් | පෙ.ව. 8.00 | ප.ව. 4.00 |

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2015 අනුව පශු වෛද්‍ය කාර්යාල වල කණිෂ්ඨ සේවකයින් සඳහා සතියේ දිනවල ප.ව. 3.45 න් පසු රාජකාරි නොපවතී නම් එම නිලධරයන්ට ප.ව. 3.45 ට කාර්යාලයෙන් බැහැරව යාමට ඉඩ දීමට ආයතන ප්‍රධානියාට හැකියාව ඇත.

| පශු වෛද්‍ය කාර්යාල - සෙනසුරාදා | පැමිණීම | පිටවීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරීන්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් ඇතුළු නිලධාරීන් | පෙ.ව. 8.30 | ප.ව. 12.15 |
| කණිෂ්ඨ සේවකයින් | පෙ.ව. 8.00 | ප.ව. 12.45 |

එන්.එල්.එන්.එස්. පෙරේරා
පළාත් අධ්‍යක්ෂ (දකුණ)

පිටපත් :

01. ප්‍රධාන ලේකම් - දකුණු පළාත
02. ලේකම් - ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය, දකුණු පළාත

මෙම රාජ්‍ය පරිප ලන/රාජ්‍ය............ ........./
...................................... / පළාත්
ලිපිය 2024-01-01
2025-12-29
ලේකම් / පරිශී.

දකුණු පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2025

මගේ අංකය : PD/S/DAPH/AO/EST-43-3
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
නූපෙ. මාතර

2025.12.

අතිරේක පළාත් අධ්‍යක්ෂ/විෂය විශේෂඥ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පළාත් කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට.
සියලු පශු වෛද්‍ය නිලධාරීන් / සත්ත්ව පාලන නිලධාරීන්.
ස්ථාන භාර නිලධාරීන් - සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය.
ස්ථාන භාර නිලධාරී - කැකණඳුර ගොවිපොළ.

<u>රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම.</u>

උක්ත කරුණට අදාළව පේරාදෙණිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2024/09/20 දිනැති 09/2024 චක්‍රලේඛය සංශෝධන සහිතව දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා මෙම පළාත් චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

**01. රාජකාරි වේලාවන් තුළ ප්‍රතිකාර කිරීම**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් රජයේ පශු වෛද්‍ය කාර්යාල හෝ පශු රෝහල්වල ඩිස්පැන්සරියේ හෝ ක්ෂේත්‍රයේ සේවා සැපයීමේදී සත්ත්ව රෝග සඳහා ප්‍රතිකාර කිරීම, රෝග නිවාරණය, රෝග වැළැක්වීම, ශල්‍යකර්ම සිදු කිරීම, මරණ පරීක්ෂණ සිදු කිරීම, රෝග විනිශ්චය සඳහා රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීම වැනි කරුණු සඳහා අය කළ යුතු සේවා ගාස්තු පහත සඳහන් වේ.

**2.1 කෘෂිකාර්මික සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් කෘෂිකාර්මික සතුන් සඳහා රාජකාරි වේලාවන් තුළ කාර්යාලයේදී හෝ ජංගම සායනයේ දී හෝ ක්ෂේත්‍රයේදී ප්‍රතිකාර කිරීමේදී, සත්ත්ව රෝග පනතේ ( 1992 අංක 59 දරණ සත්ව රෝග පනත) උපලේඛන ගත රෝග නිවාරණ එන්නත් ලබා දීමේදී, වෘත්තීමය හෝ උපදේශක ගාස්තු වශයෙන් කිසිදු සේවා ගාස්තු අය කිරීමක් සිදු නොකළ යුතුයි. එහෙත් මරණ පරීක්ෂණ ගාස්තු හෝ රසායනාගාර ගාස්තු අය කළ හැකිය.

**2.2 කෘෂිකාර්මික නොවන සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සුරතල් සතුන්ට ප්‍රතිකාර කරන වේලාව පහත පරිදි වේ.

සතියේ දින - පෙ.ව. 8.30 - පෙ.ව.10.30 දක්වා
සෙනසුරාදා දින - පෙ.ව. 8.30 - ප.ව. 12.15 දක්වා

රජයේ පශු වෛද්‍ය නිලධාරියෙක් විසින් පශු වෛද්‍ය කාර්යාලයේදී හෝ පශු රෝහලක දී රාජකාරි වේලාවන් තුළ කෘෂිකාර්මික නොවන සතුන්ගේ රෝග පරීක්ෂාව, නිර්ණය, නිවාරණය සහ ප්‍රතිකාර කිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි සේවා ගාස්තු අය කළ යුතුය.

............ලන/රාජ්‍ය................................./
..........................චක්‍රලේඛය / උපදෙස්
2026-01-01 දින සිට
2025-12-30
ලේකම් / සහකාර ලේකම් / ...ජරනි.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

I. උපදේශන ගාස්තු අය කිරීම (සතෙකු සඳහා)

| | | |
|---|---|---|
| II. | නොමුහුන් සුනඛයින් / බළලුන් | රු.300.00 |
| III. | දෙමුහුන් සුනඛයින් / බළලුන් | රු.150.00 |
| IV. | සුරතලයට ඇති කරන පක්ෂීන් | රු.300.00 |
| V. | අශ්වයින් සහ පෝනීන් | රු.1000.00 |
| VI. | අලි ඇතුන් | රු.2000.00 |
| VII. | අනෙකුත් කෘෂිකාර්මික නොවන සතුන් | රු.200.00 |
| VIII. | සුරතල් මත්ස්‍යයින් | රු.200.00 |
| IX. | සුරතල් සතුන් සඳහා සෞඛ්‍ය සහතික නිකුත් කිරීම | රු.1000.00 |
| X. | එන්නත් වට්ටෝරුවක් පමණක් නිකුත් කිරීම | රු.100.00 |

ii. නිවාරණ එන්නත් ලබා දීමේදී සේවා ගාස්තුව - රු.100.00

iii. ශල්‍යකර්ම සේවා ගාස්තුව (සතෙකුට)

| | | |
|---|---|---|
| a. | Surgical Sterilization / Castration - Dogs | රු.2000.00 |
| b. | Surgical Sterilization / Castration - Cats | රු.1500.00 |
| c. | Cosmetic Surgery | රු.700.00 |
| d. | Non Invasive surgery without anesthesia | රු.700.00 |
| e. | Invasive surgeries under anesthesia | රු.2000.00 |
| f. | Wound dressing | රු.500.00 |
| g. | Removal of sutures, pops, Dressing W/O anesthesia | රු.300.00 |
| h. | Collection of tissue sample | රු.200.00 |

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය....................................../
...................................................වක්‍රලේඛය / උපදෙස්
ලිපිය 2026-01-01 දින සිට
දකුණු පළා...
ගරු ආ... 2025-12-29
දින ලබා දී ඇති බව සහතික ක...
...................................................
...ලේකම් / සහකාර ලේකම් / පරීක්.

එච්.බී.බී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

21

ජ

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය................................/
..................... [redacted] ලේඛය / උපදෙස්
ලිපිය 2026-01-01 දින සිට
දකුණු පළාත් ... අදාළ කර ( ) සඳහා
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2025-12-29.
දින ලබා දී ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / පරිපා.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

2.3 රාජකාරි ඉටු කිරීමේදී මරණ පරීක්ෂණ සඳහා ගාස්තු අය කිරීම (සතෙකුට)

| | සත්ත්ව වර්ගය | ඒකක ගාස්තුව |
|---|---|---|
| I. | Poultry | රු.100.00 |
| II. | Small Ruminants | රු.500.00 |
| III. | Swine | රු.500.00 |
| IV. | Rabbit | රු.500.00 |
| V. | Large Ruminant | රු.1000.00 |
| VI. | Nonagricultural animals | රු.500.00 |

2.4 රසායනාගාර ගාස්තු අය කිරීම

ඒ සඳහා දෙපාර්තමේන්තු අනුමත මිල ගණන් භාවිතා කළ යුතුයි. (2023.03.23 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 03/2023 – DAPH/AD/16/02/06)

2.5 නේවාසික ගාස්තු අය කිරීම

1. රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් ඉටුකරන ඕනෑම ප්‍රතිකාර කිරීමකදී කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන් සඳහා ඖෂධ, එන්නත්, රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා නියම කර ඇති මිල ගණන් හා ගාස්තු පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරන ලද නිලධාරීන් ඇතුළත් කමිටුවක් පත් කළ යුතුය. එම කමිටුව මාස 03 කට වරක් රැස්විය යුතු අතර එම කමිටුව මඟින් නිර්දේශිත මිල ගණන් පමණක් සේවා දායකයාගෙන් අය කරගත යුතුයි. එහිදී කිසියම් ගාස්තු සංශෝධනයක් සිදු වන්නේ නම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන දකුණු පළාත තුළ ක්‍රියාත්මක කළ යුතුය.

2. කෘෂිකාර්මික සතුන් සඳහා යොදාගන්නා ඖෂධ, එන්නත්, රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා සේවාලාභියාගෙන් මුදල් අය කරනු නොලබනු අතර එම ප්‍රතිකාර සම්පූර්ණයෙන්ම නොමිලේ සිදු කෙරේ.

3. මෙම සේවා ගාස්තුවලට අමතරව රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් ඉටු කරන ඕනෑම ප්‍රතිකාර කිරීමකදී කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන් සඳහා යොදාගන්නා ඖෂධ ,එන්නත් , රෝග විනිශ්චය යෙදවුම් සහ වෙනත් යෙදවුම් සඳහා නියම කර ඇති මිල ගණන් පමණක් සේවාලාභියාගෙන් අය කළ යුතුය.

4. රජයේ පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුළ ඉටු කරනු ලබන ඉහත ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් අදාළ ගාස්තු අය කර ඒ සඳහා පළාත් සභාව විසින් ලබා දී ඇති මුදල් භාර ගැනීමේ කුවිතාන්සියක් /රිසිට් පතක් අනිවාර්යයෙන්ම නිකුත් කළ යුතුය. එම මුදල නිශ්චිත වූ රජයේ ආදායම් ශීර්ෂයට බැර කළ යුතුය.

5. රාජකාරි වේලාවෙන් පරිබාහිර, සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා පුද්ගලික සේවයේ යෙදීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයෙහි XXX වැනි පරිච්ඡේදයෙහි 1.5 වගන්තිය අදාළ කර ගත යුතු වේ.

6. ආණ්ඩුකාර වේලාවෙන් පරිබාහිරව කෘෂිකාර්මික නොවන හෝ සුරතල් සතුන්ට ප්‍රතිකාර කිරීමේදී පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් කාර්යාල පරිශ්‍රය හෝ රජයේ කිසිදු දේපලක් හෝ ඖෂධ හෝ උපකරණ හෝ භාවිතයට ගැනීම නොකළ යුතුය.

අර්ථ දැක්වීම :

කෘෂිකාර්මික සතුන් - වාණිජමය පරමාර්ථයෙන් නිවසේ හෝ ගොවිපළවල ඇති කරන සතුන්
උදා : ගවයින්, එළුවන්, සූකර, කුකුළන්, ජලජ ජීවීන් වැනි

සුරතල් සතුන් - මිනිසා සමඟ මිත්‍රශීලි වාසය සඳහා ඇති කරන සතුන්
උදා : බල්ලා , බළලා , පක්ෂීන් , ජලජ ජීවීන් වැනි

කේ.එල්.කේ.එස්. පෙරේරා
පළාත් අධ්‍යක්ෂ (දකුණ)

පිටපත් :

01. ප්‍රධාන ලේකම් - දකුණු පළාත
02. ලේකම් - ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය, දකුණු පළාත

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය....................................../
.......................................චක්‍රලේඛය / උපදෙස්
ලිපිය 2026 - 01 - 01 දින සිට
දකුණු පළාත් [illegible] අදාළ [illegible] සඳහා
ගරු ආණ්ඩුකාර [illegible] අනුමැතිය 2025 - 12 - 25
දින ලබා දී [illegible] බව සහතික කරමි.
.......................................
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / පරිපා.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත